## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 1982
### රසායන විද්‍යාව - බහුවරණ පිළිතුරු

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | (4) | 16. | (5) | 31. | (2) | 46. | (2) |
| 2 | (3) | 17. | (5) | 32. | (5) | 47. | (3) |
| 3 | (3) | 18. | (1) | 33. | (1) | 48. | (3) |
| 4 | (5) | 19. | (2) | 34. | (5) | 49. | (4) |
| 5 | (2) | 20. | (3) | 35. | (2) | 50. | (5) |
| 6 | (4) | 21. | (1) | 36. | (1) | 51. | (3) |
| 7. | (4) | 22. | (1) | 37. | (1) | 52. | (all) |
| 8. | (4) | 23. | (1)/(5) | 38. | (5) | 53. | (1) |
| 9. | (5) | 24. | (3) | 39. | (4) | 54. | (5) |
| 10. | (1) | 25. | (4) | 40. | (5) | 55. | (2) |
| 11. | (2) | 26. | (1) | 41. | (2)/(4) | 56. | (all) |
| 12. | (2) | 27. | (3) | 42. | (2) | 57. | (3) |
| 13. | (3) | 28. | (4) | 43. | (4) | 58. | (4) |
| 14. | (1) | 29. | (2)/(3) | 44. | (3) | 59. | (3) |
| 15. | (1) | 30. | (4) | 45. | (2) | 60. | (4) |

### "අ" කොටස - ව්‍යුහගත රචනා පිළිතුරු

**ප්‍රශ්නය 1**

(a) 1. A සහ I මූල ද්‍රව්‍යයන්ට උසස් ප්‍රථම අයනීකරණ ශක්තීන් තිබේ. එම නිසා මේ මූල ද්‍රව්‍යයන් O/18 කාණ්ඩයට අයත් වේ. ස්ථායි ඉලෙක්ට්‍රෝන වින්‍යාසය බිඳීමට වැඩි ශක්තියක් අවශ්‍ය වේ. B හා J මූල ද්‍රව්‍යයන් ගේ ප්‍රථම අයනීකරණ ශක්තිය අඩුය. එම නිසා IA/I කාණ්ඩයට අයත් වේ. $S^1$ ඉලෙක්ට්‍රෝන පහසුවෙන් ඉවත් කර ස්ථායි ඉලෙක්ට්‍රෝන වින්‍යාසයක් ලබාදිය හැක.

2. B මූල ද්‍රව්‍යය.
B සහ J වල දෙවැනි අයනීකරණ ශක්තිය වැඩි වන්නේ ස්ථායි ඉලෙක්ට්‍රෝන වින්‍යාසය බිඳීමට අවශ්‍ය වන බැවිනි.

3. i. $ns^2$ වර්ගයට අයත් ඉලෙක්ට්‍රෝන වින්‍යාසයක් C මූල ද්‍රව්‍යයේ තිබෙන අතර $ns^2np^1$ වර්ගයට අයත් ඉලෙක්ට්‍රෝන වින්‍යාසයක් D මූල ද්‍රව්‍යයට තිබේ. සම්පූර්ණ වූ $ns^2$, $ns^2np^1$ ට වඩා ස්ථායිය. එම නිසා $np^1$ වර්ගයෙන් ඉලෙක්ට්‍රෝනයක් ඉවත් කිරීමට $ns^2$ න් ඉලෙක්ට්‍රෝනයක් වෙන් කිරීමට වඩා අඩු ශක්තියක් අවශ්‍ය වේ.

ii. A සහ I එකම කාණ්ඩයට අයත් වන මූල ද්‍රව්‍යයන් දෙකය. එහෙත් A වල පරමාණුක අරය I වලට වඩා අඩුය.

(b) නව නිර්දේශයට අනුව පිළිතුරු අනවශ්‍ය වේ.

**ප්‍රශ්නය 2**

(a) 1. $M_2SO_4$ ලවණයේ 4.25 g තිබෙන ස්ඵටිකරණ ජලයේ

ප්‍රමාණය = $\frac{3.75}{18}$ mol

$M_2SO_4$ සාපේක්ෂ අණුක ස්කන්ධය = 142

∴ $M_2SO_4$ ලවණයේ 142 g තිබෙන ස්ඵටිකරණයේ,

ජලයේ ප්‍රමාණය = $\frac{3.75}{18} \times \frac{142}{4.25}$ = 7 mol

∴ x = 7

2 ජලය ලීටර 1 ක හයිඩ්‍රේටයේ ස්කන්ධය = 6.70 x 5 g

∴ හයිඩ්‍රේටයේ සාන්ද්‍රණය = $\frac{6.70 \times 5}{268}$ mol $l^{-1}$

= 0.125 mol $l^{-1}$

∴ $M^+$ සාන්ද්‍රණය = 2 × 0.125 mol $l^{-1}$ = 0.25 mol $l^{-1}$

(b) නව නිර්දේශය අනුව පිළිතුරු අනවශ්‍ය වේ

(c) පරමාණුක ක්‍රමාංකය 28 තිබෙන මූල ද්‍රව්‍යයේ (y = 2) ඉලෙක්ට්‍රෝන වින්‍යාසය $1s^2, 2s^2, 2p^6, 3s^2\,3p^6, 3d^8$

**ප්‍රශ්නය 3**

(a) i.



P Q

ii.



(b) i. ටොලන්ස් ප්‍රතිකාරකය (ඇමෝනියා, සිල්වර් නයිට්‍රේට්) ද්‍රාවණයක් අම්ල දෙකට වෙන වෙනම එකතු කළ විට ෆෝමික් අම්ලයෙන් රිදී කැටපතක් ලැබෙන අතර ඇසිටික් අම්ලයෙන් නොලැබේ.

ii. ජලය සමග සංයෝග දෙක වෙන වෙනම රත් කළවිට සෝඩියම් බෙන්සෝවේට් වලින් සුදු පාට අවක්ෂේපයක් සෑදෙන අතර සෝඩියම් ෆීනේට් වලින් එවැන්නක් නොලැබේ.

iii. බ්‍රෝමෝ බෙන්සීන් ද්‍රාවණයට කාබන් ටෙට්‍රා ක්ලෝරයිඩ් එකතු කර ද්‍රාවණයට ක්ලෝරීන් වායුව යැවූ විට දුඹුරු පාටක් ඇති වේ. බ්‍රෝමින් විස්ථාපනය වී කාබන් ටෙට්‍රා ක්ලෝරයිඩ් වල දියවන බැවිනි. ක්ලෝරෝ බෙන්සීන් වලින් එවැන්නක් සිදු නොවේ.

(c) නයිලෝන් - 66 $[NH(CH_2)_6-NH-CO-(CH_2)_4-CO]_n$

**ප්‍රශ්නය 4**

(a) i. සෑදුන ජලයේ මෞල සංඛ්‍යාව = $\frac{5.4}{18}$ = 0.3 mol

∴ හයිඩ්‍රජන් වල ස්කන්ධය = 0.6 g

සෑදුන $CO_2$ වල මෞල ගණන = 0.3 mol

C පරමාණුවල ස්කන්ධය = 3.6 g (12 x 03)

ඔක්සිජන් වල ස්කන්ධය = 5.8 - 4.2 = 1.6 g

පරමාණුක අනුපාතය C : H : O

$= \frac{3.6}{12} : \frac{0.6}{1} : \frac{1.6}{16} = 3:6:1$

එකෙන් බෙදූ විට 3 : 6 : 1 = අනුභවික සූත්‍රය = $C_3H_6O$

ii. R වල තිබිය හැකි එකම ක්‍රියාකාරී කාණ්ඩය

$>C=O$ විය යුතුය.

∴ අණුක ස්කන්ධය = $C_3H_6O$

iii. R විය හැක්කේ,

$(CH_3)_2C = O$ හෝ $CH_3CH_2CHO$

නමුත් T වල අසමමිතික කාබන් පරමාණුවක් ඇති බැවින්



Scanned by CamScanner

